# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2338/18 – 2023 ජුනි මස 27 වැනි අඟහරුවාදා – 2023.06.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2021/24.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එච්.බී.ජී.රුකුම්තලා මිය ඇතුළු සේවක පිරිස, අංක 202 ඒ, බේරුගොඩ වත්ත,උළුවිටකේ.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, අංක 19,පහළ ඩික්සන් පාර, ගාල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,පිළියන්දල, බුද්ධාලෝක පාර, අංක 40හි කේ.ඒ.තිලකරත්න මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මනූෂ නානායක්කාර,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ජුනි මස 08 වැනි දින,
කොළඹ දීය.

1A – G 039772 – 14 (2023/06)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/04/2021/24.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එච්.බී.ජී.රැකුම්තලා මිය ඇතුළු සේවක පිරිස, අංක 202 ඒ, බේරුගොඩ වත්ත,උළුවිටකේ.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, අංක 19,පහළ ඩික්සන් පාර, ගාල්ල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ –

'' දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සේවය කරන එච්.බී.ජී.රකුම්තලා මිය ඇතුළු පහත නම් හා ආරම්භක වැටුප සඳහන් සේවකයින් 11 දෙනා හට ලිපිකරු තනතුරේ මූලික වැටුප ලෙස වසර 13ක්, ලබාදී ඇති මෙහි සඳහන් වැටුප් පරිමාණයන් 2019 ජුනි මස සිට මූලික වැටුප රු.13,450/- ක් ලෙස අඩු කර ගෙවීම මගින් අසාධාරණයක් සිදුව තිබේද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමි විය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.''

| නම | ආරම්භක මූලික වැටුප |
|---|---|
| 01. තුසිත නලින් ද සිල්වා | රු.14,610 |
| 02. කපිල මංජුල ඕපාත | රු.14,280 |
| 03. චමිලා දර්ශනී නානායක්කාර | රු.14,280 |
| 04. පද්මලතා නාපගේ | රු.14,610 |
| 05. කේ.කේ. මාලි ප්‍රියන්කා | රු.14,610 |
| 06. එච්.බී.ජී.රැකුම්තලා | රු.14,610 |
| 07. මනෝමා ගමගේ | රු.14,280 |
| 08. නෙල්කා ලංකා සමරවික්‍රම | රු.14,610 |
| 09. දිල්හානි අබේසේකර | රු.14,610 |
| 10. ජීවනී සිරිවර්ධන | රු.14,520 |
| 11. නිමේෂිකා උදනි | රු.14,280 |

**බී. කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 මැයි මස 26 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේදී දින යොදන ලදී.

EOG 06 - 0203

මගේ අංකය: IR/COM/04/2022/296.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩබ්.කේ.ආතවුද ආරච්චි මයා, අංක. 159/4, බෝරුක්ගමුව, පල්ලෙවෙල.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රීලංකන් කේටරින් ලිමිටඩ්, එයාර්ලයින් සෙන්ටර්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල, කටුනායක.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතලේ, හිග්ගොල්ල පාර, පළමු පටුමඟ, අංක. 36/64, ඒ.බී.හේරත් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ජුනි මස 22 වැනි දින,
කොළඹ දීය.

මගේ අංකය: IR/COM/04/2022/96.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත ( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩබ්.කේ.ආතවුද ආරච්චි මයා, අංක. 159/4, බෝරුක්ගමුව, පල්ලෙවෙල.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රීලංකන් කේටරින් ලිමිටඩ්, එයාර්ලයින් සෙන්ටර්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල, කටුනායක.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ –**

'' ඩබ්.කේ.ආතවුද ආරච්චි මහතාට 2020 වර්ෂයට අදළ ප්‍රසාද දීමනව සඳහා හිමිකමක් තිබේ ද, හිමිකමක් තිබේ නම් එය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.''

**බී. කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 මාර්තු මස 19 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේදී දින යොදන ලදි.

EOG 06 - 0204

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.